# වලසා ගේ ඉරණම?



පුන්‍යා චාන්දනී ද සිල්වා

**වලසා කී විට ඔබේ මනසේ මැවෙන්නේ එතරම් අපූරු චිත්‍රයක් නොවේ. එයිනුදු ග්‍රිස්ලි වලසා** (Grizzly bear) **ගේ අනන්‍යතාව සමඟ බද්ධ වී තිබෙන්නේ ඉතාම රෞද්‍ර වූ ගති පැවතුම් ය.**

කිලෝ ග්‍රෑම් 400 ක බර ඇති, සිටගත් විට මීටර් 2.7 ක් පමණ උස, ග්‍රිස්ලි වලසකු ඔබට මුණ ගැසුණේ නම් ඔබේ ජීවිතය පිළිබඳ ආශාව අතහැර දැමුවද වරදක් නැත. නිරායුධව ඔබ මුණගැසුනේ නම්, ග්‍රිස්ලි වලසාට ඔබ ඉතාම හොඳ ආහාරයක් වනු ඇත. නිරායුධ මිනිසකුට ග්‍රිස්ලි වලසකුගෙන් බේරී යෑමට අවසර ලැබුනොත් ඒ එම පුද්ගලයාගේ වාසනාව අනුව පමණි.

ඇමරිකාවේ බටහිර ප්‍රදේශ සුදුජාතික ජනාවාස වීමට පෙරාතුව ග්‍රිස්ලි වලසුන් දහස් ගණනින් සිටියහ. ඇලස්කාව සහ කැනඩාව වැනි ප්‍රදේශවල තවමත් ග්‍රිස්ලි වලසුන් දහස් ගණනක් සිටියද ඇමරිකාවේ ප්‍රාන්ත 48 ක සිටින ග්‍රිස්ලි වලස් ගහණය 300 - 400 අතර ප්‍රමාණයක් වේ. මෙම වලස් ගහණය ශීඝ්‍ර ලෙස පහළ බසින හෙයින් දෝ 1975 ඇමරිකා එක්සත් ජනපදයේ වඳවීමේ සතුන් ආරක්ෂා කිරීමේ පනත යටතේ ආරක්ෂාව ලබා දී ඇත.

ඇමරිකාවේ වනජීවී හා මත්ස්‍ය සේවය කියා සිටියේ යෙලෝස්ටෝන් ජාතික වනෝද්‍යානයේ ග්‍රිස්ලි වලසුන්, වඳවීමේ තර්ජනයෙන් දුරස්ථව සිටින නිසා පනතින් ලබා දී තිබෙන ආරක්ෂාව ඉවත් කරන ලෙසයි. ඒත් මේ පිළිබඳ පරිසර සංවිධාන බලවත් විරෝධය පළකරන ලදී. ඇමරිකාවේ ජාතික වනජීවී ෆෙඩරේෂණයේ ජ්‍යෙෂ්ට නීති නිලධාරි "ටොම් ෆ්‍රාන්ස්" සඳහන් කරන්නේ, යෙලෝස්ටෝන් ජාතික වනෝද්‍යානයේ ග්‍රිස්ලි වලසුන් ඉතාම සෞඛ්‍ය සම්පන්නව සිටිනවා. 1975 දී ග්‍රිස්ලි වලසුන් වඳවීමේ ලැයිස්තුවට ඇතුළත් කරන විට යෙලෝස්ටෝන් වනෝද්‍යානයේ සිටි ග්‍රිස්ලි වලස් ගහණය 200 කට වැඩි නොවුනද අද එම සංඛ්‍යාව 450 සිට 600 ක් අතර වෙනවා යනුවෙනි.

> ඇමරිකාවේ වනජීවී සහ මත්ස්‍ය සේවාව ග්‍රිස්ලි වලසුන් ආරක්ෂාකර ගැනීමට පුරෝගාමී වී සිටී. මුල දී වසරකට පැටවුන් 15 බැගින් බෝ කිරීම සඳහා වූ මෙම ව්‍යාපෘතිය වසරකට පැටවුන් 40 ක් බිහිකරවීම දක්වා වූ වර්ධන වේගයක් ලබා තිබේ.


ග්‍රිස්ලි වලසුන් බේරාගැනීමේ සංගමයේ සම්බන්ධීකාරක ඇඩ්මිටිස් ක්‍රිස් සර්වනින් සඳහන් කරන්නේ, මීට අවුරුදු 25 කට පෙරාතුව මම මෙම සේවාවට සම්බන්ධ වන විට ග්‍රිස්ලි වලස් ගහණය මේ තරමට ම වර්ධනය වෙතැයි නොසිතූ බව ය.

වඳවීමේ තර්ජනය යන ලේබලය කිසිම සතෙකු වෙනුවෙන් ස්ථිර වූ අදහසක් නොවේ. වඳවීමේ තර්ජනයට පත්ව සිටින සතුන් වෙනුවෙන් වූ ෆෙඩරල් පනත මඟින් ඒ බව තහවුරු වේ. සත්ත්වයා ගේ ඉදිරි පැවැත්මට ප්‍රමාණවත් පරිදි ප්‍රජනන කාර්යය සිදු වුනොත් එතැනින් ඉදිරියට එම සත්ත්වයා වඳවීමේ තර්ජනයට අයිති යැයි වූ ලේබලයෙන් ඉවත් විය යුතුය.

ඇමරිකාවේ වනජීවී සහ මත්ස්‍ය සේවාව ග්‍රිස්ලි වලසුන් ආරක්ෂාකර ගැනීමට පුරෝගාමී වී සිටී. මුල දී වසරකට පැටවුන් 15 බැගින් බෝ කිරීම සඳහා වූ මෙම ව්‍යාපෘතිය වසරකට පැටවුන් 40 ක් බිහිකරවීම දක්වා වූ වර්ධන වේගයක් ලබා තිබේ. ග්‍රිස්ලි වලස් ගහණය ගතවුන අවුරුදු කීපය තුළ 7% ක වර්ධනයක් ලබා ඇති අතර 1996 සිට ඔවුන් ගේ මරණ අනුපාතය 4% ක් හෝ ඊට අඩු ප්‍රතිශතයක් දක්වා පහළ බැස තිබේ.

මිනිස් - වලස් ගැටුම පිළිබඳ වූ සම්බන්ධතාව ලිහිල්වීම මරණ අනුපාතය පහළ බැසීමට හේතුවී තිබේ.


හිම වලසා


ඇමරිකානු කළු වලසා


යෝධ පැන්ඩා


හිරු වලසා

> ඇමරිකාවේ ජාතික උද්‍යානවල බැටළුවන් මුදා හැරීම නිසා වලසුන්ට ප්‍රමාණවත් පරිදි ආහාර ලැබුණි. ගෝන දඩයම්කරුවන්, කැලි කසළ මුදාහැරීමත් සමග, වලසුන් ඒවා ආහාරයට ගෙන මරණයට පත්වීම ද ග්‍රිස්ලි වලසුන් විෂයයෙහි එල්ල වුන තර්ජනයකි. පාරිසරික බලධාරීන් මඟින් අපද්‍රව්‍ය මුදාහැරීමට තහංචි පැනවීම ද ග්‍රිස්ලි වලසුන් ගේ ජීවිතයට එල්ල වුන තර්ජන ඉවත් වීමට හේතු විය.

ඇමරිකාවේ ජාතික උද්‍යානවල බැටළුවන් මුද හැරීම නිසා වලසුන්ට ප්‍රමාණවත් පරිදි ආහාර ලැබුණි. ගෝන දඩයම්කරුවන්, කැලි කසළ මුදහැරීමත් සමග, වලසුන් ඒවා ආහාරයට ගෙන මරණයට පත්වීම ද ග්‍රිස්ලි වලසුන් විෂයයෙහි එල්ල වුන තර්ජනයකි. පාරිසරික බලධාරීන් මඟින් අපද්‍රව්‍ය මුදහැරීමට තහංචි පැනවීම ද ග්‍රිස්ලි වලසුන් ගේ ජීවිතයට එල්ල වුන තර්ජන ඉවත් වීමට හේතු විය.

ග්‍රිස්ලි වලසාගේ නම, වඳවීමේ ලැයිස්තුවෙන් ඉවත් කළ දිනට ඉහත කී ජීවිතාරක්ෂක පිළිවෙත් ඉබේටම අහෝසි වීම සාමාන්‍ය සිද්ධියකි. එවිට මෙම සතුන් දඩයමට අවසර ලැබෙන අතර වලස් වාසස්ථානවලට කසළ මුදහැරීම, දැව කැපීම, පතල් හැරීම සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් ද ඉබේටම අවසර ලැබෙනු ඇත. බ්‍රිතාන්‍යයේ කොලම්බියාව හැරුනවිට, ඉඩහෝ මොන්ටානා සහ වයෝමිං ප්‍රදේශවල ද වලස් දඩයමට තවමත් අවසර ලැබී නැත. වලස් දඩයමට අවසර දෙනවා නම්, ඇමරිකානු ප්‍රාන්ත 48 ක අං සහිත බැටළුවන් හා මූස් ගෝනුන් දඩයමට මෙන් දැඩි නිරීක්ෂණ යටතේ බලපත්‍ර නිකුත් කිරීම වැදගත් ය. එහි අතුරු ප්‍රතිඵල ලෙස ග්‍රිස්ලි වලස් ගහණය පහළ බසින්නේනම් යළිත් මෙම වලසා ආරක්ෂිත ලැයිස්තුව යටතේ ආරක්ෂා කිරීමට අවසර ඇත.

ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමේ කවුන්සලයේ ලූසියා විල්කොක්ස් සඳහන් කරන අන්දමට, 'ග්‍රිස්ලි වලසා දැන් සිටින්නේ දැඩි සත්කාර ඒකකයෙන් පිටතයි. නමුත් ප්‍රතිකාර නොකර රෝහලෙන් පිටත් කිරීමට තරම් සුවයක් වලසාට නැහැ.'

ග්‍රිස්ලි වලසා "වඳවීමේ තර්ජනයට ලක් වූ" ලැයිස්තුවට ඇතුළත් කිරීමෙන් ලබා ඇති ආරක්ෂාව, එම ලේබලය ගැලවූ විට අහෝසිවීම ගැන තවදුරටත් සාකච්ඡා කළ යුතුව ඇත. තවමත් නීතිගතව නොමැති මේ කරුණු උදෙසා, ඉදිරි මාස තුනක කාලයේ දී පක්ෂව හෝ විපක්ෂව ලැබෙන සාධක අධ්‍යනය කිරීමෙන් අනතුරුව "වඳවීමේ තර්ජනයට පත් වූ" යන ලේබලය තවදුරටත් ඇලවීමේ හෝ ගැලවීමේ අයිතිය ඉතිරිව තිබේ.

# වලස් නෑදෑයෝ

## හිම වලසා

බර කි. ග්‍රෑ. 200 - 800 අතර

දිග - මීටර් 2.57

ජීවත්වන ප්‍රදේශ - ග්‍රීන්ලන්තය, නෝර්වේ, කැනඩාව, රුසියාව, ඇලස්කාව

මිනිසුන් විසින් මස් පිණිස හිමවලසා දඩයම් කරනු ලබයි. සීල් මත්ස්‍යයා හිමවලසා ගේ ප්‍රධානතම ආහාරය යි. වායුගෝලය උණුසුම් වන විට, හිම වලසාට අවශ්‍ය මත්ස්‍ය ආහාර පිළිබඳ ගැටලුවට මුහුණදීමට සිදුවේ. මෙම ශතවර්ෂය අවසාන වන විට හිම වලසා වඳවීමේ තර්ජනයට පත්වීමට ඉඩ ඇතැයි අනුමාන කෙරේ.

## ඇමරිකානු කළු වලසා

බර - කි. ග්‍රෑ. 60 - 300 අතර

දිග - මීටර් 1.9

ජීවත්වන ප්‍රදේශ - කැනඩාව, ඇමරිකාවේ රොකී කඳු ආශ්‍රිත ප්‍රාන්ත 32 ක සහ උතුරු මෙක්සිකෝව ආදී ප්‍රදේශවල.

මිනිසුන් මගහැර ජීවත්වීමට උත්සාහ කළ ද හසුවුන විටෙක ප්‍රහාර එල්ල කරති. වඳවීමේ තර්ජනයට මුහුණ දී නැති ඇමරිකානු කළු වලස් ගහණය සතුටුදායක මට්ටමක පවතී.

## යෝධ පැන්ඩා

බර - කි. ග්‍රෑ. 125

දිග - මීටර් 1.93 ක් පමණ වේ

ජීවත්වන ප්‍රදේශ - බටහිර චීනයේ සචුආන්, ෂාන්ක්සි සහ තැන්සු ප්‍රදේශවල

ඉතාම ලජ්ජාශීලීය. මිනිසුන්ට හිරිහැරයක් නොමැත. මිනිසුන් මගහැර ජීවත්වීමට ප්‍රිය ය. ඉතාම ප්‍රබල ලෙස වඳවීමේ තර්ජනයට පත්ව සිටින පැන්ඩාවන්ගේ ගහණය 1000 කටත් අඩුය.

## හිරු වලසා (Sun Bear)

බර - කි. ග්‍රෑ. 25 - 65

දිග - මීටර් 1.5 කට අඩු ය

ජීවත්වන ප්‍රදේශ - ඉන්දියාව, බුරුමය, ලාඕසය, දකුණු චීනය, වියට්නාමය, තායිලන්තය වැනි රටවල.

හිරු වලසා දැනුම් දීමකින් තොරව ම මිනිසාට පහර දේ. මෙම වලසුන් ජීවත්වන වනාන්තර එළි පෙහෙළිවීමත්, දඩයක්කරුවන්ගේ ඉලක්ක බවට පත්වීමත් ඔවුන්ගේ වඳවීම පිටුපස ඇති ප්‍රබල හේතු අතර වේ. වඳවීමේ තර්ජනයට මෙම වලස් විශේෂය පත්ව සිටිනවාද / නැද්ද පිළිබඳ නිශ්චිත ලෙස ම තීරණයකට එළැඹීමට ප්‍රමාණවත් තරම් සාධක තවමත් ලැබී නැත.

❑